

මුදල් අමාත්‍යාංශය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

කාර්ය සාධන වාර්තාව - 2020

වැය ශීර්ෂය - 297

நிதி அமைச்சு

கம்பனிகள் பதிவாளர் திணைக்களம்

செயலாற்றுகை அறிக்கையும் - 2020

செலவினத்தலைப்பு– 297

Ministry of Finance

Department of the Registrar of Companies

Performance Report - 2020

Expenditure Head - 297

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර

1.3 අරමුණු හා ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.6 සමාගම් අරමුදල

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

2.2 අභියෝග

2.3 ඉදිරි ඉලක්ක

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

3.7 මු.රෙ.208 ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිහය බලපා ඇති ආකාරය

6.3 මානව සම්පත් සංවර්ධනය

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව



1815 දී ශ්‍රී ලංකා ආර්ථිකය ඉංග්‍රීසි පාලනයට නතුවීමත් සමඟම කෝපි, තේ හා රබර් වැනි ප්‍රධාන අපනයන බෝග වගාවන් ආරම්භ කරමින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රය පුළුල් කිරීමට ඉංග්‍රීසීන් විසින් කටයුතු කර ඇත. ව්‍යාපාරික කටයුතු පහසු කරලීම සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචිය 1861 දී සංයුක්ත ස්කන්ධ සමාගම් ආඥාපනතින් ආරම්භ කර ඇත. 1948 පෙබරවාරි 04 වැනිදා දක්වා පැවති ඉංග්‍රීසි පාලන කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචිය 1897 සංයුක්ත ස්කන්ධ බද්ධ ආඥාපනත හා 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනත යටතේ සිදු කර ඇත.

මෙම පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පිහිටුවා, එම දෙපාර්තමේන්තුවට වෙළෙඳ ලකුණු ආඥාපනත, ව්‍යාපාර නාම ආඥාපනත, සීට්ටු ආඥාපනත හා සමිති ආඥාපනත ක්‍රියාත්මක කිරීමේ වගකීමද පවරා ඇත. 1979 අංක 02 දරණ ජාතික බුද්ධිමය දේපළ සංග්‍රහ පනතේ විධිවිධාන අනුව 1980 වර්ෂයේදී ජාතික බුද්ධිමය දේපළ දෙපාර්තමේන්තුවක් පිහිට වූ අතර එම දෙපාර්තමේන්තුවට 1981 වර්ෂයේදී වෙළෙඳ ලකුණු ආඥාපනත ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරා ඇත.

නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රය දේශීය අනන්‍යතාවයකින් යුක්තව ක්‍රියාත්මක වූ අතරම එයට පහසුකම් සපයමින් 1982 අංක 17 දරණ සමාගම් පනත 1982 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය. මෙම පනත වසර 25 ක් පමණ ක්‍රියාත්මක වූ අතරම එම පනත තවදුරටත් සරල කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුළුල්වීම සැළකිල්ලට ගෙන විශාල ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට පහසුකම් ලබා දෙමින් 2007 අංක 07 දරණ සමාගම් පනත 2007 මැයි මස 03 වන දින සිට ක්‍රියාත්මක වේ.

1.2 ආයතනයේ දැක්ම හා මෙහෙවර

දැක්ම

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශ ආවරණය කරමින් සංස්ථා යහපාලනය පිළිබඳව හැඳියාවක් ක්‍රම ක්‍රමයෙන් බිහි කිරීමට සමත්සක්‍රීය නියාමන අධිකාරියක් ඇති කිරීම තුළින් විශ්වාසනීය ව්‍යාපාරික පසුබිමක් සංවර්ධනය කිරීම හා පෝෂණය කිරීම

මෙහෙවර

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව රජයේ ආර්ථික ප්‍රතිපත්තියට හා වෙළෙඳ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් ඇති වන සේ අදාළ පනත් යටතේ ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබා දීමට හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීමට පරිශ්‍රමයක් දරයි.



1.3 අරමුණු හා ප්‍රධාන කාර්යයන්

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- සමිති ආඥාපනත - 123 වන අධිකාරිය
- 1935 අංක 61 දරණ සීට්ටු ආඥාපනත
- 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත

මගින් දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යයන් ඉටු කිරීම, නියාමනය හා මෙහෙයවීමට නෛතික ප්‍රතිපාදන සලසා ඇත.



1.4 සංවිධාන සටහන



1. CPMSO–Chief Public Management Service Officer
2. DO – Development Officer
3. PMSO – Public Management Service Officer
4. ITA – Information Technology Assistant
5. ICTA – Information & Communication Technology Assistant
6. ICTO – Information & Communication Technology Officer
7. CIO – Companies Inspector Officers
8. OES – Office Employees Service
9. Building O. – Building Overseer
10. OR – Official Receiver

1.5 <u>දෙපාර්තමේන්තුවේ ව්‍යුහය.</u>

i. තොරතුරු සැපයීමේ අංශය

ii. සමාගම් නාම අනුමත කිරීම හා නව සමාගම් සංස්ථාපනය කිරීමේ අංශය

iii. සමාගම් වල තොරතුරු යාවත්කාලීන කිරීමේ හා ලේඛන ලියාපදිංචි කිරීමේ අංශ

iv. ඈවර කිරීමේ අංශය

v. නැවත ලියාපදිංචි කිරීමේ අංශය

vi. සමිති ලියාපදිංචි කිරීමේ අංශය

vii. සමාගම් ලේකම්වරු සහ විගණකවරු ලියාපදිංචි කිරීමේ අංශය

viii. පොදු කොන්ත්‍රාත් (ටෙන්ඩර්) අංශය

ix. ලේඛනාගාරය සහ විමර්ශන ශාලාව

x. නඩු පැවරීමේ අංශය

xi. ගිණුම් අංශය

xii. ආයතන අංශය

xiii. අභ්‍යන්තර විගණන අංශය

xiv. තොරතුරු තාක්ෂණ අංශය

xv. නිල භාර ගැනුම්කාර අංශය

i. <u>තොරතුරු සැපයීමේ අංශය</u>

පාරිභෝගික විමසීම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට හැකියාව ඇති මනාව පුහුණුව ලැබූ සහ අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු විසින් තොරතුරු සැපයීමේ අංශයේ සේවය සැපයීම සිදු කරනු ලබයි. මහජනයා විසින් සපයනු ලබන ලේඛණ මෙම අංශයෙන් පරීක්ෂාවට භාජනය වන බැවින් මහජනයා අපහසුතාවයට පත්වීමකින් තොරව ලියාපදිංචි ලේඛන වල සහතික පිටපත් නිකුත් කිරීම කාර්යක්ෂමව / මනාව සිදු කර ගැනීමට හැකියාව ලැබේ.

ii. <u>සමාගම් නාම අනුමත කිරීම හා නව සමාගම් සංස්ථාපනය කිරීමේ අංශය</u>

- **සමාගම් නාම අනුමත කිරීම.**

  සමාගමක් විසින් නමක් අයදුම් කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කල පසු ඒ සමාගමේ දත්ත පද්ධතිය පරීක්ෂා කර බලා, එම නමට අනුමැතිය ලබා දීම සමාගම් පනතට හා නාමය අනුමත කිරීමේ රීතීන්ට අනුකූලදැයි වාර්තා කිරීම සහ පුද්ගලයින් සහ ආයතනයන්ට තම සමාගම් වලට අදාළව ලියාපදිංචි අංකයන් ලබා දීම සහ යම් නමක් යටතේ සමාගමක් දැනටමත් සංස්ථාපනය කර ඇද්ද යන්න වාර්තා කිරීම.

- **නව සමාගම් සංස්ථාපනය කිරීමේ අංශය**

  සමාගම් සංස්ථාපනය කිරීමට අදාළව මාර්ගගත ක්‍රමය ඔස්සේ ලැබෙන අයදුම්පත් වල නිරවද්‍යතාවය පරීක්ෂා කර බලා නිවැරදි ලේඛන ලියාපදිංචියට ඉදිරිපත් කිරීම සහ දෝෂ සහිත ලේඛන වල අඩුපාඩු කවරේදැයි අදාළ පාර්ශව වෙත දැන්වීම, ඒ සම්බන්ධයෙන් වන මහජනතාවගේ ගැටළු වලට විසඳුම් ලබා දීම, නිවැරදි කර එවන ලද අයදුම්පත්‍ර පරීක්ෂා කර බලා නිවැරදි නම් ලියාපදිංචිය පිණිස ඉදිරිපත් කිරීම, සංස්ථාගත කිරීමේ සහතික සහ සහතික පිටපත් සැකසීම මෙම අංශය මගින් සිදු කෙරේ.

විස්තරය	භෞතික		
	2018	2019	2020
නාම අනුමත කිරීමට ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව	23,304	16,967	18,412
අනුමත කළ සංඛ්‍යාව	13,474	12,184	17,653
ක්‍රියාත්මක නොවූ අයදුම්පත් සංඛ්‍යාව	588	05	834
ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව	9,245	4,308	4



iii. <u>සමාගම් වල තොරතුරු යාවත්කාලීන කිරීමේ හා ලේඛන ලියාපදිංචි කිරීමේ අංශ</u>

ලේඛන ලියාපදිංචි කිරීම සහ ලේඛන වල සහතික පිටපත් නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට අයත් වේ. මෙම අංශ වල කාර්යයන් සංවර්ධන නිලධාරීන් 13 ක්, කළමනාකරණ සේවා නිලධාරීන් 28 ක් සහ උපාධිධාරී අභ්‍යාසලාභී 03 කගේ සහයෝගයෙන් සිදු කරනු ලැබේ. සෑම අංශයක්ම සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. මෙම අංශ මඟින් දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යයන් සිදුවේ. 2020 වර්ෂ අවසානය වන විට දෙපාර්තමේන්තුව තුළ සමාගම් වල තොරතුරු යාවත්කාලීන කිරීමේ අංශ පහක් ක්‍රියාත්මක විය.

iv. ඇවර කිරීමේ අංශය

- 2007 අංක 394 දරණ සමාගම් පනතේ 07 වගන්තිය යටතේ නාමය කපා හැරීම.
- වත්කම් වගකීම් නොමැති සමාගම් වල නාමයන් කපා හැරීම.

මෙහිදී සමාගමේ සියළුම අධ්‍යක්ෂවරුන්ගේ හා අධ්‍යක්ෂක නොවන කොටස් හිමියන්ගේ දිවුරුම් ප්‍රකාශ හා ඉල්ලීම් ලිපියක් ලබාගන්නා අතර ඉන් පසු එම දිවුරුම් ප්‍රකාශ සඳහා නියෝග ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබයි. ඉන්පසු සමාගම් 9 (සමාගමට) සහ දේශීය ආදායම් කොමසාරිස්ට විමසීමේ ලිපි සකසන අතර එම ලිපිවල දින සිට මසක් සහ දින 10ක කාලය තුල සමාගම් 10 සහ සමාගම් 04 ලිපි සකසනු ලබයි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් සමාගමේ නාමය කපා හැරීමට විරෝධතාවයක් නොමැති බව දන්වා එවූ පසු භාෂා තුනෙන් ගැසට් නිවේදනය සකසන අතර එම ගැසට් නිවේදනය පලවී මාස 03ක කාලයක් ගිය පසු සමාගමේ නාමය කපා හැරීම සිදු කරනු ලබයි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විරෝධතා පවතින සමාගම් සම්බන්ධයෙන්ද ඒ පිළිබඳව දැනුවත් කර ලිපි සකසනු ලබයි.

- වාර්ෂික වාර්තා ගොනු කර නොමැති ගොනු සඳහාද නාමය කපා හැරීමට නියෝග ලබා ගැනීමෙන් පසු ඉහත ආකාරයෙන්ම ලිපි සකසා කටයුතු කරනු ලබයි.

01. වත්කම් වගකීම් පවතින සමාගම් සම්බන්ධයෙන් ඇවරකරුවෙකු පත් කිරීමෙන්
    - ❖ සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන්
    - ❖ ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන්
    - ❖ අධිකරණ නියෝගයකින්

    යන තෙයාකාරයෙන් එක් ආකාරයකට සමාගම විසුරුවා හැරීම සිදු කරනු ලබයි.

මෙහිදී ගොනු කරන ලේඛන ලියාපදිංචි කරන අතර අවසන් ලේඛනය ලියාපදිංචි කර මාස 03කින් පසු සමාගම විසුරුවා හැරීම සිදු කරනු ලබයි. අධිකරණ නියෝගයකින් ගණන් බේරා විසුරුවා හරින විට අවසන් අධිකරණ නියෝගය ලියාපදිංචි කිරීමෙන් පසු විසුරුවා හැරීම සිදු කරනු ලබයි.

02. සමාගම් ඒකාබද්ධ කිරීමෙන් පසු එම සමාගම් වල නාමයන් කපා හැරීමට කටයුතු කිරීම.
03. සමාගම් වල නාමයන් කපා හැරීම පරීක්ෂා කිරීමට දෛනිකව පැමිණෙන සේවාදායකයන් සඳහා ලෙජරයන් පරීක්ෂා කර බලා ප්‍රකාශ කිරීම සහ ඉල්ලීම් ලිපි සඳහා අදාළ ලේඛන නිකුත් කිරීම.
04. මාර්ගගත ක්‍රමය ඔස්සේ ද මේ වන විට නාමය කපා හැරීමේ කටයුතු සිදු කරනු ලබයි.
05. තවද නාමය කපා හැරීමට දිවුරුම් ප්‍රකාශ ලබා දුන්නද ඉන් පසුව සමාගම පවත්වා ගෙන යාමට අවශ්‍ය සමාගම් වලින් දිවුරුම් ප්‍රකාශ ලබාගෙන නාමය කපා හැරීමේ නියෝග අවලංගු කිරීමට කටයුතු කිරීම හා ඒ සම්බන්ධව ලිපි සැකසීම.

විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් සංඛ්‍යාව (2020.12.31 දක්වා)

	2017	2018	2019	2020
සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම	46	52	43	21
ණයහිමියන් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම	10	11	09	05
අධිකරණයෙන් ඇවර කිරීම	02	04	06	01
පනතේ 394 යටතේ නම කපා හැරීම	298	332	381	210
ඒකාබද්ධ කිරීම හේතුවෙන් නම කපා හැරීම	32	74	46	29
එකතුව	388	473	485	266



v. නැවත ලියාපදිංචි කිරීමේ අංශය

2007 අංක 07 දරණ සමාගම් පනත හඳුන්වාදීමත් සමඟ සමාගම් නැවත ලියාපදිංචි කිරීම සඳහා මෙම අංශය 2007 මැයි මස ස්ථාපනය කරන ලදී. සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් මෙම ඒකකය ක්‍රියාත්මක විය. 2007 වර්ෂයේ මැයි මස සිට 2020.12.31 දිනට නැවත ලියාපදිංචි කළ මුළු සමාගම් සංඛ්‍යාව25,077 ක් වේ.

සමාගම් වර්ගය / වර්ෂය	සී/ස පෞද්ගලික සමාගම් (PV)	සී/ස පොදු සමාගම් (PB)	පොදු ලැයිස්තුගත සමාගම් (PQ)	ඇපයෙන් සීමිත සමාගම් (GA)	ඇපයෙන් සීමිත සමාගම් 2 (GL)	සීමාරහිත සමාගම් (UC)	එකතුව
2013	24	4	0	7	0	0	35
2014	14	0	0	3	1	0	18
2015	4	0	1	0	0	0	5
2016	1	1	0	1	0	0	3
2017	2	0	0	0	0	0	2
2018	3	0	0	0	0	0	3
2019	2	1	0	0	0	0	3
2020	0	0	0	0	0	0	0



vi. <u>සමිති ලියාපදිංචි කිරීමේ අංශය</u>

සමිති ලියාපදිංචි කිරීමේ අංශයද සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකුගේ අධීක්ෂණයෙන් සහ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ.මේ සඳහා විෂය ලිපිකරුවන් දෙදෙනෙකු ද පත් කර කටයුතු සිදුකරගෙන යයි. මෙම අංශය මඟින් නව සමිති ලියාපදිංචි කිරීම සහ සමිති වල තොරතුරු යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ. 2020.12.31 දින වන විට ලියාපදිංචි කර ඇති මුළු සමිති සංඛ්‍යාව 16,165ක් වේ.

සමිති වර්ගය	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
විහාරස්ථාන	528	75	28	32	21	16	18	06	01
සර්වෝදය	26	-	-	-	-	-	-	-	-
මිතුරු සංවර්ධන	64	76	33	43	83	48	09	-	-
ඉසුරු සංවර්ධන	09	04	-	-	-	-	-	-	-
කාන්තා සමිති	02	-	-	-	-	-	-	-	-
ග්‍රාමීය සංවර්ධන	11	-	-	-	-	-	-	-	-
ග්‍රාමශක්ති	-	-	-	-	-	-	1037	2431	98
ජල	-	-	-	-	-	-	-	-	09
වෙනත් (සුභසාධක)	39	14	10	15	21	15	22	18	32
එකතුව	**679**	**169**	**71**	**90**	**125**	**79**	**1086**	**2455**	**140**



vii. සමාගම් ලේකම්වරු සහ විගණකවරු (ගණන් පරීක්ෂකවරු) ලියාපදිංචි කිරීමේ අංශය

1987 සමාගම් ලේකම්වරයන් පිළිබඳ නියෝග යටතේ අදාළ සුදුසුකම් සපුරා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සමාගම් ලේකම්වරයෙකු ලෙස ලියාපදිංචි කිරීම සහ 1964 සමාගම් ගණන් පරීක්ෂක නියෝග යටතේ අදාළ සුදුසුකම් සපුරා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ගණන් පරීක්ෂක ලෙස ලියාපදිංචි කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. 2020.12.31 වන දිනට සමාගම් ලේකම්වරු 641දෙනකු හා ගණන් පරීක්ෂකවරු 315 දෙනකු ලියාපදිංචි කිරීම සිදු කර ඇත.

විගණකවරුන් සහ සමාගම් ලේකම්වරුන් ලියාපදිංචි කිරීම

වර්ෂය	විගණකවරු	සමාගම් ලේකම්වරු
2012	31	599
2013	64	444
2014	63	566
2015	72	534
2016	29	680
2017	26	817
2018	20	815
2019	11	264
2020	315	641



viii. පොදු කොන්ත්‍රාත් (ටෙන්ඩර්) අංශය

1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ රුපියල් මිලියන 05 ට වැඩි කොන්ත්‍රාත් සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කොට ටෙන්ඩර්කරුවෙකු වෙනුවෙන් හෝ අනුනියෝජිතයෙකු, උප අනුනියෝජිතයෙකු, නියෝජිතයෙකු හෝ නාම්කයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම, අළුත් කිරීම සහ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම, අළුත් කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම

වර්ෂය	ප්‍රමාණය	ආදායම(රු.)
2012	4414	2,998,000.00
2013	4320	6,966,000.00
2014	9196	13,794,000.00
2015	12046	20,568,000.00
2016	17875	29,949,500.00
2017	19275	31,174,500.00
2018	24743	39,502,500.00
2019	23962	41,895,000.00
2020	19233	44,608,336.00



වාර්ෂික පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි ආදායම (රු.)



ix. ලේඛනාගාරය සහ විමර්ශන ශාලාව

ලේඛනාගාරය සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර කළමනාකරණ සේවා නිලධාරීන් සහ කාර්යාල සේවකයින්ගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

සමාගම් ගොනු හා සමිති ගොනු භෞතිකව පරීක්ෂා කර බැලීම සඳහා ගාස්තු ගෙවීමෙන් පසු සේවාලාභී මහජනතාවට විමර්ශන ශාලාව තුළ නිසි අධීක්ෂණය යටතේ ඉඩකඩ සලසා ඇත.

දෛනිකව ලේඛනාගාරය තුළ ඇති ගොනු සංඛ්‍යාවද ක්‍රමයෙන් වර්ධනය වන බැවින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය පරිගණකගත කිරීමේ අවශ්‍යතාවය ලේඛනාගාරයට සුවිශේෂී වේ.

x. නඩු පැවරීමේ අංශය

දෙපාර්තමේන්තුවේ නඩු පැවරීමේ කටයුතු නිලධාරීන් සතර දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් මෙහෙයවනු ලබයි. සමාගම් පනත යටතේ කොන්දේසි කඩ කරනු ලබන සමාගම් වලට හා අධ්‍යක්ෂකවරුන්ට එරෙහිව නඩු පැවරීමේ කටයුතු මෙම අංශය විසින් සිදුකරනු ලබයි. 2020 වර්ෂයේදී අලුතින් නඩු පැවරීම් 19 ක් සිදුකර ඇත.

xi. ගිණුම් අංශය

දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු නිසි පරිදි සිදු කරගෙන යාම සඳහා මෙම අංශය ස්ථාපිත කර ඇති අතර, ප්‍රධාන ගණකාධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ කළමනාකරණ සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන්ගේ සහයෝගයෙන් ගිණුම් අංශයේ රාජකාරි කටයුතු සිදුවේ.

xii. ආයතන අංශය

දෙපාර්තමේන්තුවේ පරිපාලනමය කටයුතු ක්‍රමවත්ව සහ නිසි පරිදි කරගෙන යාම සඳහා මෙම අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශයේ රාජකාරි කටයුතු කළමනාකරණ සේවා නිලධාරීන්ගෙන් සහ සංවර්ධන නිලධාරීන් මඟින් සිදුවන අතර අංශයේ අධීක්ෂණය පරිපාලන නිලධාරියෙකු මඟින් සිදුවේ.

xiii. අභ්‍යන්තර විගණන අංශය

2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර ඇති අතරගණකාධිකාරීවරයෙකු සහ නිලධාරීන් දෙදෙනෙකු ද පත් කර ඇත. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කර ගැනීමට අදාළව විගණන කටයුතු කරගෙන යාම සඳහා මෙම අංශය ක්‍රියාත්මක වේ.

xiv. තොරතුරු තාක්ෂණ අංශය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ අතර තවත් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරන එක් ප්‍රමුඛ අංශයක් වශයෙන් තොරතුරු තාක්ෂණ අංශය හඳුන්වා දීමට හැකිය.(තොරතුරු තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂකවරයෙකුගේ මූලිකත්වයෙන් මෙම අංශයේ පාලන කටයුතු මෙහෙය වේ).

මෙම අංශයේ කාර්ය භාරය ඉතා පුළුල් වශයෙන් ප්‍රසාරණය වීම ආරම්භ වූයේ දෙපාර්තමේන්තුවෙන් ඉටුවන මුඛ්‍ය අරමුණ වන මුළු දිවයිනම ආවරණය වන පරිදි සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය මෙතෙක් පැවති ලිපිගොනු මූලික වූ ශ්‍රමික ක්‍රියාවලිය (Manual Process) වෙනුවට මාර්ගගත කළ පරිගණක ක්‍රියාවලිය හෙවත් “eRoc Online Process” හඳුන්වා දීමත් සමඟය. මෙම සුවිශේෂී ක්‍රියාවලිය මුල්වරට හඳුන්වා දෙනු ලැබුවේ 2018 වර්ෂයේ අප්‍රේල් මස සිටය.

මෙම ක්‍රියාවලිය හඳුන්වා දීමත් සමඟ මෙතෙක් පැවති ක්‍රමවේදය තුළ දී දක්නට ලැබුණු ප්‍රායෝගික දුර්වලතාවයන් හඳුනා ගැනීමටත් ඒවාට කඩිනම් විසඳුම් ලබා දීමටත් මෙම සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ඉතා කෙටි කාලයක් තුළ දී කාර්යක්ෂමව මෙන්ම ඵලදායී ලෙස පාරිභෝගිකයින් මූලික කරගත් (Client Oriented) ක්‍රියාවලියක් බවට පත් කිරීමටත් තොරතුරු තාක්ෂණ අංශය මඟින් විවිධ පියවරයන් ගන්නා ලදී.

එසේ ගනු ලැබූ පියවරයන් අතර සුවිශේෂී ඒවා කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

- පරිශීලක මිත්‍රශීලි (User Friendly) ක්‍රියාවලියක් හඳුන්වා දීම.
- සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා ගත වන කාලය හැකි පමණ අවම කිරීම.
- අදාළ ගාස්තු ගෙවීම් අන්තර්ජාලය හරහා ම ඉටු කිරීමේ පහසුකම් ලබා දීම.
- මෙතෙක් තමන් විසින් ම සකස් කළ අයදුම්පත් වෙනුවට පරිගණකය වෙත තමන් විසින් ඇතුළත් කරන දත්ත උපයෝගි කර ගනිමින් ස්වයංක්‍රීයව ම (System Generated Applications) අයදුම්පත් සහ ඒ ඒ අදාළ ආකෘති පත්‍ර සකස් කර ගැනීමට හැකි වීම.
- පාරිභෝගිකයින් හට තමන් විසින් ලියාපදිංචි කළ ආයතන පිළිබඳ තොරතුරු තමන්ට අවශ්‍ය අවස්ථා වලදී තමන්ගේ පරිශීලක තොරතුරු (User Login Details) උපයෝගී කර ගනිමින් අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී ඕනෑම ස්ථානයක දී පරිගණකය භාවිතා කර ලබා ගත හැකි වේ.
- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කටයුතු සඳහා පැමිණෙන පාරිභෝගිකයින් සඳහා පරිගණක භාවිතා කිරීමේ පහසුකම් තොරතුරු තාක්ෂණ අංශය තුල දී සලසා දී ඇත.
- අවශ්‍ය අවස්ථාවලදී eRoc Online Process පිළිබඳව තොරතුරු සහ උපදෙස් ලබා දීමට කටයුතු ක්‍රියාත්මක කර දී ඇත.
- පාරිභෝගිකයින් වෙත අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික උපදෙස් ලබා දීමටත් මෙම අංශය මඟින් කටයුතු යොදා ඇත.
- පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩමුළු වරින්වර පැවැත්වෙනු ඇත.

1.6 සමාගම් අරමුදල

2007 අංක දරණ සමාගම් පනතේ 479 වැනි වගන්තිය යටතේ සමාගම් අරමුදල පිහිටුවා ඇත. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ එකඟත්වය මත, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන ආකාරයට මෙම අරමුදල පවත්වා ගෙන යනු ලැබේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් මෙම පනත යටතේ නියම කරනු ලබන, පනවනු ලබන හෝ අය කරනු ලබන සෑම ගාස්තුවකින්ම හෝ අයකිරීමකින්ම තුනෙන් දෙකොටසක් (2/3) සමාගම් අරමුදලට ගෙවනු ලැබිය යුතුය. මෙම පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟතාවය මත සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා නියමිත සියළු මුදල් මෙකී අරමුදලින් ගෙවිය හැකිය.

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

- රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ ඇගයීම් වැඩසටහන අනුව කාර්ය සාධනය වෙනුවෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මඟින් පිරිනමනු ලබන සම්මාන තිළිණ සහ විශිෂ්ඨතා ඇගයීම් සහතික 2015 සහ 2016 යන මුදල් වර්ෂ සඳහා දිනා ඇත.

2.2 අභියෝග

- දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය පරිගණකගත කිරීමේ e–Roc ව්‍යාපෘතිය උපරිම සාර්ථකත්වයෙන් ක්‍රියාවේ යෙදවීම.
- e–Roc ව්‍යාපෘතිය යටතේ මාර්ගගත ක්‍රමය මඟින් සිදු කරනු ලබන දෙපාර්තමේන්තුමය ක්‍රියාවලිය නියාමනය කිරීම සඳහා දැනට පිහිටුවා ඇති තොරතුරු තාක්ෂණ අංශය, තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂවරයෙකුගේ අධීක්ෂණය යටතේ විධිමත් කර ගැනීම.
- පවතින කාර්යභාරයට ගැළපෙන පරිදි තොරතුරු තාක්ෂණ නිලධාරී කාර්ය මණ්ඩලය පුළුල් කර ගැනීම සහ පුහුණු කිරීම.
- e–Roc ව්‍යාපෘතියේ කාර්යභාරයට යෝග්‍ය පරිදි දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල පුළුල් කිරීම සහ නවීකරණය කර ගැනීම. (දැනටමත් අවසාන අදියරේ පවතී.)

2.3 ඉදිරි ඉලක්කයන්

- දෙපාර්තමේන්තුවෙන් නියාමනය කරනු ලබන සියළු පනත් වලට අදාළ ක්‍රියාවලීන් අන්තර්ජාල මාර්ගගත ක්‍රමය යටතේ අවම කාලයක් තුළ ඉටු කර දෙමින් කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- අන්තර්ජාතික දර්ශකයක් වන " ව්‍යාපාර කිරීම පහසු කිරීමේ දර්ශකය " (Ease of Doing Business Index) හි ඉහළ ස්ථානයක් ශ්‍රී ලංකාවට හිමි කර දීම සහ ව්‍යාපාර වලට සහ ව්‍යවසායකයින්ට හිතකර සහ පහසු පරිසරයක් නිර්මාණය කිරීම.

ඒ.කේ.ඩී.ඩී.අරන්දර
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

ඒ. කේ. ඩී. ඩී. අරන්දර
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක. 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

x

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2020		සටහන	තත්ත්‍ය 2020	2019	
-	ආදායම් ලැබීම්		391,787,205	287,605,130	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
398,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	391,787,205	287,605,130	
-	මුළු ආදායම් ලැබීම් (අ)		391,787,205	287,605,130	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		-	-	ඒසිඒ-3
-	කැන්පතු		88,579	121,495	ඒසිඒ-4
3,300,000	අත්තිකාරම් ගිණුම්		8,562,485	7,681,262	ඒසිඒ-5
-	වෙනත් ලැබීම්		4,330,336	4,044,381	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		12,981,400	11,847,138	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		404,768,605	299,452,268	
	අඩුකළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
72,300,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	71,096,190	65,305,354	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	-	-	ඒසිඒ-2(ii)
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	-	
1,200,000	පොළී ගෙවීම්	8	1,058,400	893,282	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
73,500,000	මුළු පුනරාවර්තන වියදම් (ඇ)		72,154,590	66,198,636	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
-	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
-	මුළු මූලධන වියදම් (ඉ)		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		10,729,990	11,173,851	
	කැන්පතු ගෙවීම්		88,579	121,495	ඒසිඒ-4
7,000,000	අත්තිකාරම් ගෙවීම්		10,641,411	11,052,356	ඒසිඒ-5
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		82,884,580	77,372,487	
-	2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		321,884,025	222,079,781	

2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කණ්ඩායම 2020 රු.	කණ්ඩායම 2019 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	-	-
මූල්‍ය වත්කම්			
අත්කිකාරම ගිණුම	ඒසිඒ-5/5(ඒ)	24,086,353	22,007,427
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	141,128,888	50,705,312
මුළු වත්කම්		165,215,241	72,712,739
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්			
දේපළ පිරියත හා උපකරණ සංචිතය		-	-
කුලී හා වැඩ අත්කිකාරම සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ජංගම වගකීම්		24,086,353	22,007,427
තැන්පතු ගිණුම	ඒසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	141,128,888	50,705,312
මුළු වගකීම්		165,215,241	72,712,739

පිටු අංක ...5... සිට ...53... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ...54... සිට ..61. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදිරිව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : එස්.ආර්.ආටිගල
තනතුර : ලේකම
දිනය : 2021.02.22

.....

ගණන්දීමේ නිලධාරි
නම : ඒ.කේ.ඩී.ඩී.ඩී.අරන්දර
තනතුර : සමාගම රෙජිස්ට්‍රාර් ජනරාල්
දිනය : 2021.02.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : එල් දහනායක
දිනය : 2021.02

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර
ඇමිණුම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක. 400, ඩී. ආර්. විජේවර්ධන මාවත.
කොළඹ 10.

ලක්ෂ්මි දහනායක
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී.ආර්. විජේවර්ධන මාවත
කොළඹ - 10.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	391,787,205	287,605,130
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	60,814	91,008
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	391,848,019	287,696,138
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	63,579,376	57,185,070
සහනාධාර සහ මාරුකිරීම්		-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	949,152	95,333
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	321,128,888	222,135,312
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	385,657,416	279,415,715
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	6,190,603	8,280,423
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා හෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	408,416	441,072
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	408,416	441,072
අඩුකළා : මුදල් වැය කිරීම්		
හෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	-	-
අත්තිකාරම් ගෙවීම්	6,515,590	8,600,000
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	6,515,590	8,600,000
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(6,107,174)	(8,158,928)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	83,429	121,495
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්		
විදේශීය ණය ආපසු ගෙවීම්		
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	83,429	121,495
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	83,429	121,495
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	(83,429)	(121,495)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-
	-	-

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන යටතේ පිළිවුවන ලද සමාගම් අරමුදල

2020.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්	2020.12.31	2019.12.31
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන විෂයන්	11	28,559,027	12,941,705
ලැබිය යුතු ආදායම්	12	4,117,608	1,336,233
ඉදිරියට කල ගෙවීම්	13	439,870	755,758
ආරක්ෂක සේවා ඇප තැන්පත්		25,000	25,000
ආයෝජන -භාණ්ඩාගාර බැඳුම්කර			765,444,981
ආයෝජන -භාණ්ඩාගාර බිල්පත්	14	32,763,191	363,940,199
ලැබිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර පොළිය	15	18,309,043	88,355,414
ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොළිය	16	372,631	23,674,074
හා.නි.ලේ ගෙන් හිලව් කල යුතු මුදල යුතු මුදල	17	587,075	
		85,173,444	1,256,473,364
ජංගම නොවන වත්කම්			
කොටස් ආයෝජන		90,275,000	90,275,000
දේපළ පිරියත හා උපකරණ	18	330,766,008	341,157,898
කෙරිගෙන යන වැඩ ගිණුම	19	130,413,915	72,888,758
හා.නි.ලේ අත්තිකාරම්	20	5,019,566,832	1,062,510,912
ආයෝජන -භාණ්ඩාගාර බැඳුම්කර	21	818,477,000	3,128,897,791
		6,389,498,755	4,695,730,359
මුළු වත්කම්		6,474,672,200	5,952,203,723
වගකීම්			
ජංගම වගකීම්			
හා.නි.ලේ ගෙවිය යුතු මුදල්	22	1,174,150	
දේ.ආ.කොා. ගෙවිය යුතු වැට	23	278,796	
උපචිත වියදම්	24	5,047,009	17,732,654
පොදු තැන්පත් ගිණුම්	25	8,265,108	55,047
		14,765,063	17,787,701
ජංගම නොවන වගකීම්			
මුළු වගකීම්		14,765,063	17,787,701
ශුද්ධ වත්කම්		6,459,907,137	5,934,416,023
ශුද්ධ වත්කම්/ස්කන්ධය			
සමුච්චිත අතිරික්තය / ඌනතාවය	26	6,459,907,137	5,934,416,023
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය		6,459,907,137	5,934,416,023

Lakshmi Dahanayaka

ලක්ෂ්මි දහනායක
ප්‍රධාන ගණකාධිකාරී
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී.ආර්. විජේවර්ධන මාවත
කොළඹ - 10.

ලක්ෂ්මි දහනායක
ප්‍රධාන ගණකාධිකාරී

ඒ.කේ.ඩී.ඩී.ඩී.අරන්දර
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක. 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 479 (5) වගන්තිය අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශනය 2021.02.24 දින අනුමත කරන ලදි.

එස්.ආර්.ආටිගල
ලේකම්,
මුදල් අමාත්‍යාංශය

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

සමාගම් අරමුදල - 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

		2020	2019	2018
අයභාරය	සටහන්			
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ලැබීම්	1	**448,266,309.25**	**437,891,762.01**	440,465,000.41
වෙනත් අයභාර		**183,300,141.26**	**355,655,341.73**	**299,811,379.61**
භාණ්ඩාගාර බැඳුම්කර පොළිය	2	163,734,043.86	274,093,415.77	179,471,877.76
භාණ්ඩාගාර බිල්පත් පොළිය	3	8,327,397.40	71,066,508.96	108,657,226.70
භාණ්ඩාගාර බිල්පත් පොළිය - ඇවර				1,503,354.15
ගොඩනැඟිලි කුලිය	4	11,160,000.00	10,120,000.00	9,600,000.00
ආපනශාලා කුලිය	5	2,000.00	12,000.00	12,000.00
වෙනත් ආදායම්	6	76,700.00	363,417.00	566,921.00
මුළු අයභාරය		**631,566,450.51**	**793,547,103.74**	**740,276,380.02**
වියදම්				
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	7	(6,790,224.05)	(19,471,564.70)	(26,806,266.35)
සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	8	(89,123,510.57)	(62,036,873.88)	(47,597,488.78)
ක්ෂය	9	(10,987,355.95)	(11,248,385.52)	(8,852,047.40)
වෙනත් වියදම්	10	(600.00)	(350.00)	(800.00)
මුළු වියදම්		**(106,901,690.57)**	**(92,757,174.10)**	**(83,256,602.53)**
අතිරික්තය		**524,664,759.94**	**700,789,929.64**	**657,019,777.49**

2007 අංක 07 දරණ සමාගම් පනතේ විධි විධාන අනුව පිළිවුවන ලද සමාගම් අරමුදල

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ලේඛණය

	රු.	රු.
මුදල් පොතේ ආරම්භක ශේෂයන්		
ගිණුම් අංක 100153298050 හි ශේෂය		12,941,705.23
එකතු කළා- ලැබීම්		
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (මුදල්, චෙක්පත්)-143100153298050	529,331,153.42	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (අන්තර්ජාල- සම්පත් බැංකුව)	165,082,796.78	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (අන්තර්ජාල-නේෂන් ට්‍රස්ට් බැංකුව)	26,853,838.80	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (ලංකා බැංකුව)	109,077,228.88	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (සෘජු ලැබීම)	1,336,500.69	
පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (වැට)	157,880.00	
හා.නි.ලේ. ගෙවීම් - අත්තිකාරම් හිලව් කිරීම	42,357,005.25	
මුදල් ඇණවුම් ආදායම් ලැබීම්	71,816.00	
ගොඩනැඟිලි කුලිය	11,160,000.00	
භාණ්ඩාගාර බිල්පත්වලින් ලද පොළිය	183,312,465.25	
භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමෙන් ලද මුදල	359,548,200.00	
භාණ්ඩාගාර බිල්පත් වට්ටම් කිරීමෙන් ලද මුදල	3,859,985,151.76	
විවිධ තැන්පත්	8,251,840.73	
ආපනශාලා කුලිය	2,000.00	
විවිධ ආදායම්	76,700.00	5,296,604,577.56
		5,309,546,282.79
<u>අඩු කළා- ගෙවීම්</u>		
අතිකාල හා නිවාඩු දින වැටුප්	3,041,422.94	
ගමන් වියදම් - දේශීය	106,517.00	
ගමන් වියදම් - විදේශීය		
ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	4,915,934.34	
ඉන්ධන	1,357,086.43	
නිල ඇඳුම්	100,000.00	
වෛද්‍ය සැපයීම්	15,000.00	
වෙනත් (1205)	785,094.00	
වාහන නඩත්තු	540,686.55	
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ(නඩත්තු)	3,898,545.53	
ගොඩනැඟිලි (නඩත්තු)	137,540.00	
මුද්‍රණ	2,553,810.00	
තැපැල් හා සන්නිවේදන	7,637,798.00	
විදුලිය හා ජලය	10,599,757.15	
වරිපනම්	2,116,800.00	
වෙනත්(1409)	68,796,653.23	
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ - වැඩිදියුණු කිරීම්	814,842.69	
වාහන වැඩිදියුණු කිරීම්	336,887.18	
ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	69,800.00	
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	33,900.00	
කාර්ය මණ්ඩල සුභසුන් කිරීම්	190,000.00	
ප්‍රතිව්‍යුහගතකරණය	57,525,157.19	
හා.නි.ලේ අත්තිකාරම් ලබාදීම්	4,000,000,000.00	
හා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 20.03.02.10	87,291,254.83	
හා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 10.03.07.08	247,890,000.00	
එකතු කල අගය මත ගෙවීම් -දේශීය ආදායම් කොමසාරිස්	50,151,133.29	
බැංකු ගාස්තු	600.00	
භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන	729,997,438.24	
ආදායමෙන් ආපසු ගෙවීම්	41,817.20	
තැන්පත් ආපසු ගෙවීම්	41,780.00	5,280,987,255.79
මුදල් පොතේ අවසාන ශේෂයන්		
ගිණුම් අංක 100153298050 හි ශේෂය		28,559,027.00
		5,309,546,282.79

සමාගම් අරමුදල

මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	රුපි.	රුපි.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
ආදායම් වියදම් ගිණුමේ අතිරික්තය		524,664,760
ගැලපීම් :-		
ක්ෂයවීම්	10,987,356	
පොලි ආදායම	(172,061,441)	
පෙර වර්ෂයට කරන ලද ගැලපුම් (උපචිත වියදම්)	275,132	
		(160,798,953)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම්		363,865,807
ඉදිරියට කල ගෙවීම්	315,888	
ලැබිය යුතු ආදායම්	(2,781,375)	
හා.නි.ලේ. ගෙන් හිලව් කල යුතු මුදල	(587,075)	
දේ.ආ.කො. ගෙවිය යුතු වැට්	278,796	
උපචිත වියදම්	(12,685,645)	
පොදු තැන්පත්	8,210,061	
හා.නි.ලේ. ගෙවිය යුතු මුදල	1,174,150	(6,075,200)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		357,790,607
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
භාණ්ඩාගාර බැඳුම්කර කල් පිරීමෙන් ලද මුදල	4,219,533,352	
භාණ්ඩා බැඳුම්කර/ බිල්පත්වල ආයෝජනය	(729,997,438)	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	(57,965,744)	
හා.නි.ලේ. අත්තිකාරම්	(3,957,055,920)	
පොලි ලැබීම්	183,312,465	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		(342,173,286)
මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ වැඩි වීම		15,617,321
2020.01.01 දිනට මුදල් ශේෂය	12,941,705	
2020.12.31 දිනට මුදල් ශේෂය	28,559,027	
		15,617,321

සටහන -(i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය
(මු.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය: 297 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: සමාගම රෙජිස්ට්‍රාර්

වැඩසටහන් අංකය හා නාමය : 01 සමාගම් පනත පරිපාලනය

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	නැත	
රු	25,000.01	වැඩි		
	එකතුව			

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2	නැත	
3		
4		
එකතුව		

(ii) නවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	නැත	
රු	25,000.01	වැඩි		
	එකතුව			

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2	නැත	
3		
4		
එකතුව		

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	නැත
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	නැත
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	නැත
	ගණන	රු

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මූ.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2021.02 [illegible]

ලක්ෂ්මි දිසානායක
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400 බී.ගාට් වීදිය,
කොළඹ 10.

සටහන-(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

වියදම ශීර්ෂ අංකය : 297

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සමාගම් රෙජිස්ට්‍රාර්

වැඩසටහන් අංකය හා නාමය: 01 සමාගම් පනත පරිපාලනය

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය		සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	-	-
(ii)	රු. 25,000.01 වැඩි	-	-
		-	-
	එකතුව	-	-

2 වර්ෂය තුළ මූ.රෙ. 107 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම් සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1						
2 නැත						
3						
4						
5						
6						
එකතුව	-	-	-	-	-	

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2021.02 19

ලක්ෂ්මි දසනායක
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
සමාගම් මැදුර
අංක 400 බී.ගාර්. වික්ටෝරියා මාවත,
කොළඹ 10

බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

සටහන - (iii)

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: සමාගම් රෙජිස්ට්‍රාර්
වියදම් ශීර්ෂ අංකය: 297

වැඩසටහන් අංකය හා නාමය: 01 සමාගම් පනත පරිපාලනය

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් අංකය	මාසය	දිනය	ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂයය	මූල්‍යකරණය	අයිතමය පිළිබඳ විස්තරය	බැඳීම	බැඳීම් ශේෂය	බැරකම්වලට ඇතුළත් වූ දිනය	බැරකම් වර්ගීකරණය	බැරකම් සඳහා වන සංශෝධනයන්	බැරකම් නිදහස් කිරීම	බැරකම් ශේෂය
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු .... එකතුව																	
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල .... එකතුව							නැත										
3. වෙනත් (පෞද්ගලික අංශය) .... එකතුව																	
මුළු එකතුව																	

ගෙවීම්/බැඳීම්වල ස්වභාවය පහත සඳහන් ආකාරයට හඳුනාගත යුතු ය.

1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල
3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වන්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැඳීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වන්කම් හෝ සේවාව ආයතනය වෙතු ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ්‍යා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2021.02. 19

ලක්ෂ්මි දසනායක
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400 බී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: සමාගම් රෙජිස්ට්‍රාර්
වියදම් ශීර්ෂ අංකය: 297
වැඩසටහන් අංකය හා නාමය: 01 සමාගම් පනත පරිපාලනය

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව ළඟඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු .... එකතුව	නැත							
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල .... එකතුව								
3. වෙනත් (පෞද්ගලික අංශය) .... එකතුව								
මුළු එකතුව								

.....
